**ශීර්ෂය - 248 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**
**--------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 29 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය **වේ.**

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**----------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1 **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවන් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන ආකෘති අනුව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි සිංහල පිටපතේ අවස්ථා 10 ක්ද, ඉංග්‍රීසි පිටපතේ අවස්ථා 6 ක්ද සහ දෙමළ පිටපතේ අවස්ථා 8 ක් ද තිරුවල අගයන් මාරු වී සටහන් වීම, තිරුවල මුළු එකතුවන් වැරදියට දැක්වීම, අගයන් වෙනස්ව සටහන් කිරීම සහ අගයන් සටහන් නොවීම් වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | ඉදිරියේදී ගිණුම් සකස්කිරීමේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවන අයුරින් කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | අදාල මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කිරීම. |

1.6.2 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දුම්කොළ බදු ආදායම රු.38,565,392 ක් වුවද දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දුම්කොළ බදු ආදායම රු.32,140,567 ක් වුයෙන් රු.6,424,825 ක වෙනසක් නිරීක්ෂණය විය. | දුම්කොල බදු අංශය මඟින් ආදායම් වාර්තා කිරීමේ දී අදාල කාලසීමාව සඳහා අය විය යුතු මුළු බදු ආදායම පෙන්නුම් කරනු ලබයි. නමුත් ගිණුම් අංශය විසින් ආදායම් වාර්තා කිරීමේ දී අදාල කාල සීමාව සඳහා මුදලින් ලද මුළු ආදායම සඳහන් කරයි. මේ නිසා මෙම වාර්තාවල පෙන්නුම් කරනු ලබන ආදායම වෙනස් වන බව වාර්තා කරමි. | ආදායම දැක්වීමේදී ගිණුම් අංශයේ සහ ආදායම් අංශය අතර තොරතුරු සසදා නිවැරදි වටිනාකම ගිණුම්වල පෙන්විය යුතු වේ. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**(අ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම් සඳහා උපදේශක සේවය සපයා තිබුණු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අදාළ උපදේශණ ගාස්තු වියදම වූ රු.7,286,343 ක් අංක 248-1-1-2104 දරන වැය විෂයෙහි කෙරිගෙනයන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණද එයට අදාළ 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනැති අංක 194890 දරණ චෙක්පත එම ආයතනයට භාර නොදී මාස තුනකට වැඩි කාලයක් කිසිදු හේතු දැක්වීමකින් තොරව රදවාගෙන තිබී පසුව අවලංගු කර තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිල්ලේ අඩුපාඩු සකස් කරදීම හා නිර්මාණ සැලසුම් ලබාදීම සම්බන්ධව කරන ලද ඉල්ලීම් වලට මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් නොදැක්වීම නිසා මෙම චෙක්පත අවලංගු කර අප්‍රේල් මස ගිණුම් සාරාංශ මගින් රජයේ ආදායමට බැර කර ඇත. | කොන්ත්‍රාත් උපදේශක සේවාවන්ට අදාලව අදාල සේවා සැපයීම් ගිවිසුම් ප්‍රකාරව නිසි ලෙස ඉටුවී තිබේද යන්න පරීක්ෂා කර ගෙවීම් කිරීමේදී මු. රෙ. 136 - 139 අනුව කළ යුතුවීම |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් 2 ක එකතුව වූ රු. 85800 ක් පුනරාවර්තන වියදම් ලෙස බැරකම් ලේඛනයේ දක්වා තිබුණි. | වැරදීමකින් බැරකම් ලේඛනයේ පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශවල උපලේඛනවල තොරතුරු දැක්වීමේදී නිවැරදිව දැක්විය යුතුවීම. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ (SA-80) භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන අනුව රු. 1,458,163,820 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.1,458,969,403 ක් වීමෙන් රු.805,583ක වෙනසක් නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තු පොත්වල අගය නිවැරදි වේ. භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන අනුව ශේෂය හා දෙපාර්තමේන්තු පොත් ශේෂය අතර වෙනස වී ඇත්තේ UP LOARD කිරීමේදී සිදුවූ වරදක් හේතුවෙනි. ඉදිරියේදී එය නිවැරදි කර ගැනිම සඳහා කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ.සී.ඒ.2.(ii) ආකෘතියේ අංක 248-1-1-2104 දරන වැය විෂය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් පිලිවෙලින් රු. 30,055,474 ක් සහ රු. 42,895,034 ක් වුවද ඒ.සී.ඒ.6 මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂය තුල කාර්යාල ගොඩනැගිලි අත්පත්කරගැනීම් රු.30,055,474 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 42,895,034 ක වටිනාකමකින් යුතු ගොඩනැගිලි අත්පත්කරගැනීම් අඩුවෙන් දැක්විණි. | වෙනත් දෙපාර්තමේන්තු වෙත ලබාදුන් ප්‍රතිපාදන වලින් කළ වියදම් මෙලෙස වත්කම් වල අඩුවෙන් දක්වා ඇති අතර මේ වන විට මෙම වියදම් සම්බන්ධ සම්පූර්ණ වාර්තාවක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. එය ලද වහාම CIGAS වැඩසටහන මගින් වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශයේ ඒ.සී.ඒ.6 ආකෘතිය ප්‍රකාර කෙරීගෙන යන වැඩවල වටිනාකම ලෙස, 2019 ජනවාරි 01 දිනට කෙරීගෙන යන වැඩවල වටිනාකම ලෙස වාර්තාකර තිබුණු රු. 165,062,650 ක ශේෂය එලෙසම දක්වා තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ කෙරී ගෙන යන වැඩ වටිනාකම වූ රු. 45,567,771 ක් ඒ.සී.ඒ.6 ආකෘතියේ දක්වා නොතිබුණි. | මේ වන විට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් 2019 වර්ෂයේ වියදම් කිරීම් සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉල්ලා ඇති අතර එය ලද පසු කෙරීගෙන යන වැඩ යටතේ වත්කම් ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

### 1.6.4 තැන්පතු

----------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ---------------------------------- | ------------ |
| 2016 සහ 2017 වර්ෂ වල සිට ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවිය යුතු රු. 9,946,304 ක් වූ රැඳවුම් මුදල් පොදු තැන්පත්වල රඳවාගෙන තිබුණි. ගොඩනැගිල්ලේ නිර්මාණ හා සැලසුම් නිසිලෙස බාරදී නොතිබීම, ඉදිකිරීම් වල දෝෂයන් පැවතීම සහ කොන්ත්‍රාත් අධීක්ෂණය කළ ආයතනය විසින් ඒ සඳහා නිසි පියවර නොගැනීම ආදී ගැටළු මේ සඳහා හේතු වී තිබුණි. මෙම ගැටළු නිරාකරණය කර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීත් පියවර ගෙන නොතිබුණි. | මෙම දෝෂ හා අඩුපාඩු සකස්කර දෙන ලෙසත් ගොඩනැගිල්ලේ නිර්මාණ හා සැලසුම් නිසිලෙස භාරදෙන ලෙසත් ඉල්ලා අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කළද යහපත් ප්‍රතිචාර නොලැබීම මත මෙම මුදල් අප්‍රේල් ගිණුම් සාරාංශය මගින් රජයේ ආදායමට බැර කර ඇත. | කොන්ත්‍රාත්කරු සහ උපදේශක ආයතනය සමග දෙපාර්තමේන්තුව ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව ගැටළු නිරාකරණය කර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීම කළ යුතුවීම. |

## 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | ඉදිරියේදී යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාළ වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුවීම. |
| (ආ) | පුද්ගල පඩිනඩි ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව පුද්ගල පඩිනඩි ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණි. | පුද්ගල පඩිනඩි ලේඛණය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව 17 වැනි භාණ්ඩාගාර හා විගණන ආකෘතිය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |
| (ඇ) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | | |
| | මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි. | වැය ලේඛණ යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලීන කර පවත්වා ගත යුතුවීම. |
| (ඈ) | ඇප ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය පිළියෙල කර නොතිබුණි. | ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |
| (ඉ) | හානි පිළිබඳ ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි. | ඉදිරියේදී යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |

### 1.6.6 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 6000-0-0-18-0-122-0 දරන පොදු තැම්පත් ගිණුමේ 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ රු.73,346,404 ක තැම්පතු සඳහා උපලේඛනයක් ඉදිරිපත්කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා 6000-0-0-18-0122-0 දරණ පොදු තැන්පතු ගිණුමට අදාල උපලේඛනය සකස් කර ඇති අතර ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් වලට අදාලව සාක්ෂි ඉදිරිපත් කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට නොපියවන ලද රු. 43,437,909 ක අග්‍රිම ශේෂයෙන් රු. 25,273,363 ක මුදල 2021 මාර්තු මාසය දක්වාත් පියවා නොතිබුණි. | 7041629 ගිණුමේ දෙසැම්බර් 31 දිනට ශේෂය රුපියල් 25,273,363 ක මුදල මාර්තු මාසයේදී මාරු පත්‍ර මගින් 2021 අග්‍රිම ගිණුම වෙත පවරාගෙන 2020 අග්‍රිම ගිණුම පියවා ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ වලට අනුව කටයුතු කිරීම. |

### 2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මිය ගිය නිලධාරින් 09 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු. 1,636,743 ක් වූ අතර ඉන් එක් නිලධාරියෙකුගෙන් රු. 118,260 ක හිඟ ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුණි. | කඩිනමින් මෙම ණය මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර ඉදිරියේදී ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අය කර ගැනීම කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවයෙන් පහකළ, ඉල්ලා අස් වු හා සේවය අතහැර ගිය නිලධාරින් 11 දෙනෙකුගෙන් රු. 1,157,797 ක හිඟ ණය ශේෂයක් පැවති අතර ඉන් නිලධාරින් 7 දෙනෙකුගෙන් එකතුව රු. 543,723 ක හිඟ ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුණි. | සේවයෙන් පහකළ, ඉල්ලා අස්වූ හා සේවය අතහැර ගිය නිලධාරින්ගෙන් අයවීමට ඇති ණය ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඇ) | ඉහත පරිදි නිලධාරින්ගෙන් අයවිය යුතු ණය අය කරගැනිම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොමැති බව හා ඒ සම්බන්ධ පසු විපරම් කටයුතු දූර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ XXIV හා 2004 ඔක්තොම්බර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඉදිරියේදී හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

**2.3** **ආදායම් කළමනාකරණය**
**---------------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුල්‍ය ප්‍රකාශන හා හිඟ ආදායම් පිලිබඳ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මත්පැන්, රා හා ස්ප්‍රීතු නිෂ්පාදනයට අදාළව දෙපාර්තමේන්තුවට අය විය යුතු මුළු හිඟ බදු ආදායම හා ඊට අදාළ ප්‍රමාද ගාස්තුව ඇතුළුව අයවිය යුතු මුළු හිඟ ආදායම රු.මිලියන 3969.8 ක් විය. මු.රෙ 128 (1) (ඌ) සහ 128 (2) (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය විය යුතු හිඟ සුරාබදු සහ ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට අදාලව ගෙවිය යුතු ආයතන සමග සාකච්ඡා කිරීමට සහ ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරමින් ගෙවිය යුතු හිඟ සුරාබදු සහ ප්‍රමාද ගාස්තු අයකරගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | මු.රෙ 128 (1) (ඌ), 128 (2) (ඇ) සහ (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මත්පැන් නිෂ්පාදන සමාගම් 5 කට අදාළව වර්ෂ 5 ක් ඉක්ම වූ හිඟ බදු ආදායම රු.මිලියන 2,299.63 ක් විය. එහි ඇතුලත් මූලික බදු මුදල රු.මිලියන 360.61 ක් වු අතර ප්‍රමාද ගාස්තු රු.මිලියන 1939.02 ක් විය. සමාගම් 2 කින් අයවිය යුතු හිඟ ආදායම එකතුව රු.මිලියන 1,217.12 සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර රු. මිලියන 204.97 හිඟ ආදායමක් | ඉහත 2.1 (අ) පිළිතුර මඟින් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2020.12.31 දිනට පැවති හිඟ සුරාබදු සහ ඒ අනුව ගණනය කරන ලද ප්‍රමාද ගාස්තු පිළිබදවත් හිඟ සුරා බදු සහ ප්‍රමාද ගාස්තු අය කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව ඇමුණුම් මඟින්ම ඉදිරිපත් කර ඇත. | මු.රෙ 128 (1) (ඌ), 128 (2) (ඇ) සහ (ඉ) ප්‍රකාරව එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | අයවිය යුතුව තිබූ සමාගමකට සහන සැලසීම සඳහා දෙපාර්ශවයේ එකඟතාවයෙන් ගිවිසුම් ගතවීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. අනෙකුත් සමාගම් දෙකෙන් එකතුව රු.මිලියන 877.54 ක හිඟ ආදායම අයවීම් පිළිබඳව ප්‍රගතියක් වාර්තා නොවුණි. | | |
| (ඇ) | මු.රෙ.128(2) (ඇ) අනුව හිඟ ආදායම් පිළිබඳ තත්වය පෙන්නුම් කරන අර්ධ වාර්ෂික වාර්තාවක් සෑම මාස 06කටම වරක් අර්ධ වර්ෂය නිම වී එලබෙන මාසයේ අවසාන දින හෝ ඊට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද 2020 අවසන් අර්ධ වර්ෂය සඳහා වූ වාර්තාව 2021 ජනවාරි 31 වන විටත් විගණනයට ලැබී නොතිබුණි. | හිඟ ආදායම් වාර්තාව මේ වන විට විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. විෂයභාර නිලධාරීන්ගේ ස්ථාන මාරු වීම මත අතපසුවීමෙන් මෙම වර්ෂයේ හිඟ ආදායම් වාර්තාව ලබා දීමට ප්‍රමාද වූ බව පිළිගනිමි. ඉදිරියේ දී එසේ නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | මු.රෙ 128 (2) (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත සුරාබදු ආදායම වූ රු. බිලියන 130 සමග සැසඳීමේදී දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම(හිඟ ආදායම සහිතව) රු. බිලියන 120.9 ක් වූ අතර එය ඇස්තමේන්තුගත සුරාබදු ආදායමින් සියයට 93.07 ක් විය. | 2020 වර්ෂයේදී සමස්ත ලෝකයම කොවිඩ් වසංගතයට ගොදුරු වූ බව සියලු දෙනාම දන්නා වූ සත්‍යයකි. ඒ අනුව 2020 මාර්තු මාසයේ දී හා ඊට පසුවද රටේ පැවති අයහපත් සෞඛ්‍ය තත්වය නිසා නිෂ්පාදනාගාර වසා දැමීමටත් අලෙවියේ සිදු වූ පහත වැටීමත් නිසා මෙසේ ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වි ඇති බව පෙන්වා දෙමි. නමුත් අනෙකුත් ආදායම් උපදන සියලුම රාජ්‍ය ආයතනවල ආදායම ඉතාමත් අඩු මට්ටමක තිබියදී මෙම දෙපාර්තමේන්තුවේ 93.07% ක ඉහළ අගයක් වාර්තා විය. | -එම- |

**2.4 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු. මිලියන 116.6 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වැය විෂයයන්ට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු. මිලියන 83.8 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ත් සියයට 92 ත් අතර පරාසයක පැවතුණි. | 2020 වර්ෂයේ මාර්තු මස සිට රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ සැලසුම් කල කාර්යයන් ඒ ආකාරයෙන්ම අවසන් කිරීමට නොහැකි වීම මත පෙන්වාදී ඇති පරාසයන් තුල ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියල කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බදු ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදිව කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂයේ වැය විෂය 248-1-1-2106 යටතේ තිබූ රු. මිලියන 15 ක ප්‍රතිපාදන වලින් රු මිලියන 3.4 ක් අඛණ්ඩ විදුලි සැපයුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. ඉතිරි රු. මිලියන 11.6 ක ප්‍රතිපාදනය මු.රෙ 66 යටතේ අංක 248-1-1-2108 දරන වැය විෂයට මාරු කර තිබුණි. | පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් නොවීම නිසා ඒ සඳහා ගෙවීම් කිරීමට වවුචර්පත් නොලැබීම මත ප්‍රතිපාදන ඉතිරිවී ඇති අතර ඒ අනුව ඉතිරි වූ ප්‍රතිපාදන මුදල් 248-1-1-0-2108 වැය විෂය මාරු කර ගෙන ඇත. | වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදිත මුදල් අදාල කාර්ය වෙනුවෙන් නිසි පරිදි උපයෝජනය කල යුතුය. |

**2.5** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **---------------------** | **--------------------------------** | **-----------** |
| (අ) | වැය ශිර්ෂය 130 අයත් ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික්ක 2 ක අනුයුක්ත කර ඇති පුහුණු අභ්‍යාසලාභී සඳහා ගෙවිය යුතු රු. 420,000 ක දිමනා සුරාබදු දෙපාර්තමේන්තුව 248 වැය ශිර්ෂය යටතේ වු බැරකම් ලෙස දක්වා තිබුණි. | අතපසුවීමකින් බැරකම් ලේඛණය සකස් කිරීමේදී 248 වැය ශීර්ෂය යටතේ දක්වා තිබුණද ඒ සඳහා ගෙවීම් කිරීමේදී වැය ශීර්ෂ 130 යටතේ ගෙවීම් කර ගිණුම් ගත කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2020 ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අයත් පුනරාවර්තන වැය විෂයයන් 12 කට අදාළ එකතුව රු. 1,226,942 ක් වු බැරකම් 22 ක් බැරකම් ලේඛනයේ දක්වා නොතිබුණි. | අතපසුවීමකින් පෙන්වාදී ඇති බැරකම් 22 බැරකම් ලේඛණය සකස් කිරීමේදී ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. ඉදිරියේදී බැරකම් ලේඛණය නිවරදිව සකස් කරන ආකාරය පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | -එම- |
| (ඇ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වාර්තා කර නොමැති බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස ඉදිරි වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවද, 2019 වර්ෂයේදී එසේ වාර්තා නොකරන ලද අවස්ථා 15 කට අදාළව එකතුව රු.4,898,437 ක් සමාලෝචිත වර්ෂය තුලදී නිරවුල් කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට බැරකම් ලේඛණය සකස් කරන ආකාරය පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිරි වර්ෂයට අයත් ගෙවිය යුතු වියදම් 5 ක එකතුව වූ රු. 127,023 ක සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයේ දක්වා තිබුණි. | අතපසු වීමකින් මෙවැන්නක් සිදුවී ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 05/2020 ප්‍රකාරව කටයුතු කිරීම. |

## 2.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව තුළ මනා මූල්‍ය පාලනයක් සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහිතව මනා කළමනාකාරිත්වයකින් ආයතනය පවත්වාගෙන යනු ලබන අතර 2020 වර්ෂය සඳහා එහි සමාලෝචනයන් සිදුකර ලිඛිත ප්‍රකාශනයන් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකළ බව පිළිගනිමි.<br>නමුත්, 2021 වර්ෂය සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී කලින් කලට එහි සමාලෝචනයන් සිදුකරන බවත් 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව සිදුකළ යුතු ලිඛිත ප්‍රකාශය දැනටමත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බවත් දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | මෙම විගණන විමසුම් 06 න් 04 ක්ම යොමු වී තිබුණේ නිෂ්පාදනාගාරවලටයි. ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් වැළක්වීම සඳහා සියලු නිලධාරීන් වෙත අවවාද කර ඇත. මේ වන විට පිළිතුරු සකස් කර ඇති බැවින් ඉතා ඉක්මනින් ඉදිරිපත් කරමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | පෙන්වාදී ඇති කරුණු අනුව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීම සහ මූල්‍ය මෙහෙයුම් කාර්ය සාධනයේ පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | -එම- |

**2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i). මු.රෙ.104(4) | අලාභ හානි පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදවේ නම් මුදල් රෙගුලාසි 104(07) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතු වුවත් එකතුව රු. 748,907 ක් පාඩු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු සිදුකර නොමැති අවස්ථා 05ක් නිරීක්ෂණය විය. | සියලු අඩුපාඩු හා දෝෂ පද්ධතියක් ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමය සකසා ගෙන නිවැරදි කිරීමට බලාපොරොත්තු වන අතර තවදුරටත් අභ්‍යන්තර චක්‍රලේඛ සකසා කඩිනමින් නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මු.රෙ.104(4) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ii). මු.රෙ. 395(ඇ) | එක් එක් මාසයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊට පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියල කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් 2කට අදාල සැසඳුම් ප්‍රකාශ 5ක් විගණන පරික්ෂණ දිනය වූ 2021 ජනවාරි 20 වන දින වන විටත් පිළියල කර නොතිබුණි. | මේ වන විට බැංකු ගිණුම් දෙකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ සියල්ල පිළියෙල කර අවසන් කර ඇත. | මු.රෙ. 395(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ආ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය. | සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ආදායම් සංකේත සඳහා මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය. ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මේ වන විට ආදායම් සංකේත අනුව මාසික ආදායම් වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර ඇත. කෙසේ වෙතත් මෙම වාර්තාව සකස් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ මාසික ගිණුම් සාරාංශ ලද පසුව බැවින් බව ද කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| (i). 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත රු.බිලියන 130 ක් වූ මත්පැන් බදු ආදායම හා රු.මිලියන 35 ක් වූ දුම්කොළ බදු ආදායම් පිළිබඳව මාසික ඉලක්ක, එම ඉලක්ක ලගා කරගැනීමට ගන්නා ක්‍රියාමර්ග, එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මැනීම සඳහා වූ දර්ශක ඇතුලත් ආදායම් අයකර ගැනීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී ඇස්තමේන්තුගත ආදායම සම්බන්ධයෙන් වූ මාසික ඉලක්ක, එම ඉලක්ක ලහා කරගැනීමට ගන්නාවූ ක්‍රියාමාර්ග, එම ක්‍රියාමාර්ග වල ප්‍රගතිය මැනීම සඳහා වූ දර්ශක ඇතුලත් ආදායම් අයකර ගැනීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට කටයුතු කරමි. 2020 වර්ෂය සඳහා KPI ඇතුළත් ක්‍රියාකාරී සැලස්මක් සකස් කර නොතිබූ බව පිළිගනිමි. එම තත්ත්වය නිවැරදි කර ගනිමින් 2021 වර්ෂය සඳහා KPI ඇතුළත් ක්‍රියාකාරී සැලස්මක් සකස් කර ඇති බව වාර්තා කරමි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ii). 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටස මු.රෙ.756(6) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපතිවෙත 2021 මාර්තු 31 ට පෙර ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, සුරාබදු කොමසාරිස් කාර්යාල, සුරාබදු අධිකාරී කාර්යාල, විශේෂ මෙහෙයුම් ඒකක සහ සුරාබදු ස්ථාන ඇතුළුව ස්ථාන 105 කට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මාස තුනකට ආසන්න ප්‍රමාදයක් සහිතව 2021 ජුනි 22 දින ඉදිරිපත්කර තිබුණි. | රට තුල පවතින කොවිඩ් ව්‍යාප්තියත් සමග මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කිහිපයක් තාවකාලිකව වසා දැමීමත්, එම කාර්යයන් සඳහා නිලධාරින් සහභාගී කරවීමට බාධාවන් ඇතිවීමත් නිසා භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි විය. නමුත් මේ වන විට සමීක්ෂණ කටයුතු අවසන් අදියරේ පවතින අතර අදාල වාර්තා කඩිනමින් ලබාදීමට කටයුතු කරමි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛණ 1 කොටස, මු.රෙ.756(6) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (iii). 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 ඡේදය, මු.රෙ.31, මු.රෙ.880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | රජයේ මුදල් පිලිබඳ භාරකාරිත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගණන් දීමේ නිලධාරී ලෙස සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තබන බවට වග බලාගත යුතු බව දක්වා තිබුනද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය දක්වා ම එලෙස ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ඇප තැන්පත් කළයුතු නිලධාරින්ගෙන් ඇප තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 9 ඡේදය, මු.රෙ.31, මු.රෙ.880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 7041628 දරන බැංකු ගිණුමට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුමේ වූ නිකුත්කල නමුත් මාස 6 ට වැඩි කාලයක් තුල ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු. 486,373 ක් වූ චෙක්පත් 35 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාස 06 වැඩි නිකුත් කර ඇති චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කිරීමට කඩිනමින් ක්‍රියා කරමි. | මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුරාබදු දෙපාර්තමේන්තුවේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් සෞඛ්‍ය අමාත්‍යාංශ සහ වෙනත් ආයතනවල විෂය පථය යටතට ද ගැනෙන බැවින් සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථය, නිවැරදිව හඳුනාගෙන ඊට ගැලපෙන ආකාරයට අරමුණු සහ කාර්යයන් සංශෝධනය කර ගැනීම කෙරෙහි රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානය යොමුකර තිබූ අතර දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යමණ්ඩල සමග අදහස් හා යෝජනා සාකච්ඡා කර සංශෝධිත කෙටුම්පතක් සකස් කර ඇතත් මේ දක්වාත් අනුමත වී නොතිබුණි. | ඉදිරියේදී සකස්කර ඇති කෙටුම්පත අනුමත කර ගැනිම සඳහා කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝගය පරිදි කටයුතු කළ යුතුවීම. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සංචාරක යාත්‍රා මෙහෙයුම් සඳහා සුරාබදු බලපත්‍ර සංචාරක සේවා යටතේ "සංචාරක යාත්‍රා මෙහෙයුම්" සේවාවන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි නොවූ පුද්ගලික සමාගමක් යටතේ ක්‍රියාත්මක වන යාත්‍රා 8 ක් සඳහා ර.බි. 11 සුරාබදු බලපත්‍ර (භෝජනාගාර බලපත්‍ර) ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. ඒ අනුව යාත්‍රා 5 ක් සී/ස වෙළඳ හා නාවික සමාගමේ ලියාපදිංචි වී ඇති බවට සනාථකිරීම් ඉදිරිපත් කර නොතිබුණි. ලියාපදිංචි සහතික ඉදිරිපත් කරන ලද යාත්‍රාවලින් යාත්‍රා දෙකක කාලය 2019 පෙබරවාරි 11 දිනෙන් සහ 2019 මැයි 02 දිනෙන් අවසන් වී තිබුණි. සී/ස වෙළඳ හා නාවික සමාගම යටතේ වෙළඳ නැව් බඩු ප්‍රවාහනය කිරීම සඳහා මෙම යාත්‍රා ලියාපදිංචි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. සංචාරක යාත්‍රා මෙහෙයුම් සඳහා සුරාබදු බලපත්‍ර ලබාදීමට අදාළව සුරාබදු ආඥා පනතේ 25 වගන්තිය ප්‍රකාරව රීති සම්පාදනය කිරීමක්ද දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි. | 2019.03.23 හා 24 දෙදින මාතර වැලිගම නගර ශාලාවේදී පැවති එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහනේදී ගරු මුදල් අමාත්‍යතුමා විසින් ලබාදුන් නියෝග පරිදි සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී හා සහකාර සුරාබදු කොමසාරිස් විසින් ලබාදුන් නිර්දේශ පරිදි මෙම බලපත්‍ර ලබා දී ඇත.<br>නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ සංචාරක ප්‍රවර්ධනය උදෙසා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන ස්ථාන සඳහා පමණක් වන බැවින්, මෙම යාත්‍රා සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව මෙම බලපත්‍ර නිකුත් කරන ලදි. | සංචාරක යාත්‍රා මෙහෙයුම් සඳහා සුරාබදු බලපත්‍ර ලබාදීමට අදාළව සුරාබදු ආඥා පනතේ 25 වගන්තිය ප්‍රකාරව රීති සම්පාදනය කළ යුතුවීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතිය<br>රජයේ ආදායම් වර්ධනය කිරීම සඳහා වූ මත්පැන් බෝතල් හා මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ආරක්ෂිත ස්ටිකර් සැපයීම හා ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතියක් සැපයීම හා ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා 2019 ජුනි 20 දිනැති 2128/30 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි හා සුරාබදු නිවේදන අංක 04/2019 දරන මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කළ රීති පරිදි 2019 ජුලි 20 දින සිට විදේශ මත්පැන් සඳහා ස්ටිකර් යෙදීම ආරම්භ වී තිබුණි. මුදල් අමාත්‍යවරයා විසින් 2019 හා 2020 වර්ෂවල නිකුත් කළ සුරාබදු නිවේදන 04 ක් මගින් දේශීය මත්පැන් සඳහා ස්ටිකර් යෙදීම සඳහා 2021 ජුනි 30 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා විදේශ මත්පැන් සඳහා ස්ටිකර් අලෙවිය තුලින් රු. මිලියන 10.87 ක ආදායමක් අය වී තිබූ අතර ස්ටිකර් මිළදී ගැනීම වෙනුවෙන් එම කාලයට අදාළව රු. මිලියන 5.98 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම වූ රු. මිලියන 1,782 ක් වුවද මේ දක්වා දරන ලද වියදම රු. මිලියන 5.98 ක් හෙවත් සියයට 0.3 ක් පමණක් විය. මෙම ව්‍යාපෘතිය මේ වන විට විදේශිය මත්පැන්වලට පමණක් ක්‍රියාත්මක කර තිබුණි.<br>දේශීය මත්පැන් සඳහා සමාගම් සමග එකඟතාවයකට පැමිණීම සඳහා මාස 18ක් වැනි කාලයක් ගතවී තිබීම, ප්‍රධාන නිෂ්පාදන සමාගම් විසින් ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබීම, නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගතයුතුවීම, සැපයුම්කරු සමග ප්‍රසම්පාදන කටයුතු සිදුව ඇත්තේ ආරක්ෂිත ස්ටිකරයක් සඳහා වීම හේතුවෙන් නැවත ප්‍රසම්පාදනය කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය පැවතීම එ් අනුව ගිවිසුම්ගත ප්‍රසම්පාදන කටයුතු වල විෂය පථයන් සංශෝධනය කිරීම හා නව ගිවිසුම්වලට එළඹීම වැනි අවශ්‍යතා තවදුරටත් ඉටු විය යුතුව පැවතුණි. | ප්‍රධාන මත්පැන් නිෂ්පාදන සමාගම් කිහිපයක් විසින් ස්ටිකර් ඇලවීමේ ක්‍රමවේදය වෙනුවට ඩිජිටල් තාක්ෂණය මගින් ස්ටිකර් මුද්‍රණය කිරීමේ ක්‍රමවේදය භාවිතා කිරීමට ක්‍රමවේදයක් සකස්කරන ලෙසට ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව කලින් මත්පැන් නිෂ්පාදන සමාගම්වලට ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදය භාවිතා කළ නොහැකි බැවින් ඩිජිටල් තාක්ෂණය සහ ස්ටිකර් ඇලවීම යන ක්‍රම දෙකම භාවිතාකර දේශීය මත්පැන් මත ස්ටිකර් ඇලවීමට හැකිවන පරිදි මුදල් අමාත්‍යාංශය විසින් 2021 පෙබරවාරි 25 දින සුරාබදු නිවේදන 07/2021 නිකුත්කරන ලදි. එමගින් 2021 ජුනි 30 සිට දේශීය නිෂ්පාදිත මත්පැන් මත ඉහත ක්‍රමවේදයන් භාවිතකර ස්ටිකර් ඇලවීම සිදුකළ යුතු බවට නියෝග කර ඇත.<br>තවද ටෙන්ඩර් කොන්දේසි වලට අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්ශවයේම එකඟතාවය මත ස්ටිකර් වල Specification වෙනස්කල හැකි බව දක්වා ඇත. ඒ අනුව නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගින බව කාරුණිකව පෙන්වාදෙමි. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. |
| (ඇ) | පරිගණක මෘදුකාංග පද්ධතිය<br>දෙපාර්තමේන්තුවේ සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීමට අදාළව පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවැය ප්‍රතිපාදන හා පරිපූරක ප්‍රතිපාදන මඟින් රු. මිලියන 87.2 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. 2019 වර්ෂයේ ඒ සඳහා රු. මිලියන | පරිගණක මෘදුකාංග පද්ධතියේ කටයුතු යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට කඩිනමින් සිදු කරමින් පවති. ඒ අනුව යෝජිත පරිගණක මෘදුකාංග පද්ධතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනිමට බලාපොරොත්තු වේ. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | 0.745 ක් සහ සමාලෝචිත වර්ෂයේ රු මිලියන 3.4 ක වියදමක් දරා තිබුණු අතර බදු ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා වූ යෝජිත පරිගණක මෘදුකාංග පද්ධතියේ අපේක්ෂිත අරමුණු මෙතෙක් ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ඒකාබද්ධ පරිගණක දත්ත පද්ධතිය<br>රේගු දෙපාර්තමේන්තුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ වන පරිගණක දත්ත පද්ධතියක් සැකසීම සහ කඩිනමින් ක්‍රියාත්මක කිරීම හා එතෙක් ලිපි හුවමාරු කර ගැනීම මගින් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙස 2019 සහ 2020 ගිණුම්කාරක සභා රැස්වීම් වලදී කාරක සභාව විසින් උපදෙස් ලබාදී තිබුණි. එහෙත් ඒ සම්බන්ධ පරික්ෂාවේදී නිරීක්ෂණය වූයේ සුරාබදු දෙපාර්තමේන්තුව හා අදාළ ආයතන සමග ඒකාබද්ධ කර පරිගණක දත්ත පද්ධතියක් සැකසීමේ නව මුහුණුවර යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා ඉංජිනේරු උපදේශන සේවය ලබාගැනීමට අදාළ ගාස්තු ගෙවීමේ මූල්‍ය යෝජනාව ඇගයීම් අදියරේ පැවතුණු බවයි. | උපදේශණ සේවාව සඳහා සලකා බැලිය යුතු මොඩියුල නැවත සංශෝධනය සඳහා යොමු කර ඇත.<br>(RASED) පද්ධතියේ පිරිවිතර හඳුනාගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කටයුතු සිදුකරමින් පවතී. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන විශේෂඥයෙකුගේ සේවය ලබාගැනීමට ක්‍රියා කර ඇත.<br>දෙපාර්තමේන්තු මූලික තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ලබා ගැනීමට ICTA ආයතනය සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.<br>දෙපාර්තමේන්තුවේ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය හා හුවමාරු කරගැනීමේ කටයුතු ආරම්භ කරන ලදී.<br>රේගු දෙපාර්තමේන්තුවේ දත්ත හා සුරාබදු දෙපාර්තමේන්තුවේ දත්ත හුවමාරු කිරීමේ අන්නොන්‍ය අවබෝධතා ගිවිසුම් ගත වීමට කටයුතු කර ඇත. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. |
| (ඉ) | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නිදහස් කිරීමෙන් පසු ඔවුන්ගේ අධීක්ෂණය හා සුපරීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරමින් පැවති අතර 2019 වර්ෂයේ වියදම් සමග සැසදීමේදී අම්පාර ඉදිකිරීම් ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ කිසිදු මූල්‍ය ප්‍රගතියක් නොමැති බව නිරීක්ෂණය විය. එය 2018 ජනවාරි 15 දින නිමකළ යුතු වුවද වසර 3 ක් ගත වන තුරුත් නිම කිරීමට කටයුතුකර නොතිබුණි.<br>තවද පේදුරුතුඩුව හා මුලතිව් ඉදිකිරීම් ව්‍යාපෘති පිළිවලින් 2020 අප්‍රේල් 14 හා 2020 පෙබරවාරි 08 දින නිමකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රගතිය පහළ මට්ටමක පැවතිණි. සුරාබදු දෙපාර්තමේන්තුව වෙනුවෙන් උක්ත ව්‍යාපෘති අධීක්ෂණ හා සුපරීක්ෂණ කාර්යය | තොරතුරු ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට හා ඒ පිළිබඳ සැලකිලිමත්වීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීමට අභ්‍යන්තර චක්‍රලේඛන මඟින් කඩිනමින් කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කිරීම. |

සඳහා තාක්ෂණ නිලධාරියෙකු බඳවා ගැනීම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත්ම සිදු වී නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි

ඉඩම් පිළිබඳ ලේඛනය පරිදි සුරාබදු දෙපාර්තමේන්තුව සතුව කාර්යාල පිහිටි ඉඩම් 43ක් පැවති අතර ඉන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම ඇතුළු ඉඩම් 23කට අදාළව නිරවුල් ඔප්පු ලබා ගැනිමේ හෝ රජයේ ඉඩම් පවරා ගැනීම් කටයුතු මේ දක්වාත් අවසන් වී නොතිබුණි.

රාජගිරිය ප්‍රධාන සුරාබදු කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීමට ඉඩම් අමාත්‍යාංශයෙන් පැවරීමට අදාල කටයුතු කළ විගස පවරාගැනීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ. අදාල විමසීම් කර කඩිනමින් එම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රාදේශීය කාර්යාලවල ඉඩම් වලට අදාලව නිරවුල් ඔප්පු ලබා ගැනීම රජයේ ඉඩම් පවරාගැනීමට කටයුතු ආරම්භ කර ඇත. නමුත් පවතින කොවිඩ් 19 වසංගතය හා සුරාබදු දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි අංශ මඟින් ප්‍රමාදයන් සිදු වේ.කෙසේ නමුත් 2021.12.31 දිනට පෙර මෙම කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

ඉඩම්වලට අදාළ නිරවුල් ඔප්පු ලබා ගැනිම හා රජයේ ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවීම.

(උ) 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රැස්කරන ලද ශුද්ධ සුරාබදු ආදායමේ වර්ධනය /ඌනතාවය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| වර්ෂය | සුරාබදු ආදායම රු. බිලියන. | ප්‍රතිශත වෙනස |
|---|---|---|
| 2014 | 69.08 | 4.6 |
| 2015 | 105.2 | 52.2 |
| 2016 | 120.2 | 14.2 |
| 2017 | 113.2 | (5.8) |
| 2018 | 113.8 | 0.5 |
| 2019 | 115.3 | 0.3 |
| 2020 | 120.9 | 4.8 |

2016 වර්ෂයේ දී රජයේ බදු ප්‍රතිපත්තියේ සිදු වූ වෙනස් වීම මත මෙසේ අසාමාන්‍ය ලෙස සුරාබදු ආදායම ඉහළ ගිය බව මීට පෙර ඔබ වෙත වාර්තා කරන ලදි. 2017 වර්ෂයෙන් පසුව මෙම තත්වය වෙනස් වී ඇත

මු.රෙ 128 (2) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළියල කළ යුතුවීම.

(ඌ) දුම්කොළ බදු පනතට අනුව බදු අය නොකිරීම.

1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සුරුට්ටුවක්, බීඩියක් හා සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑමයක් සඳහාම බද්දක් පනවා අය කළ යුතු වුවද, නිෂ්පාදනය කරනු ලබන සුරුට්ටු සහ බීඩි සම්බන්ධයෙන් කරනු ලැබූ නියදි විගණන පරීක්ෂාවේදී එවැනි බද්දක් අයකරනු නොලබන බව නිරීක්ෂණය විය. 2020 වර්ෂය වන

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන බීඩි හා සුරුට්ටු සඳහා බද්දක් අය කිරීම සුදුසු බව නිර්දේශ කොට අංක ED/2019 හා 2019.08.26 දිනැතිව මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ඇත. අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ

1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම.

| | | | |
|---|---|---|---|
| | විට බීඩි හා සුරුට්ටු නිෂ්පාදන ආයතන 536 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින අතර ඉකුත් වර්ෂ 4 ක කාලය තුල එම ආයතන වල බීඩි සහ සුරුට්ටු නිෂ්පාදනය දල වශයෙන් ඒකක බිලියන 16 ක් පමණ විය. එම ආයතන වලින් දැනට ඉල්ලුම් පත්‍ර ගාස්තුවත්, බීඩි නිෂ්පාදන හා ගබඩා බලපත්‍ර ගාස්තුවක් සහ ආනයනය කරන ලද දුම්කොළ වෙනුවෙන් අදාළ බදු මුදලක් පමණක් අයකරනු ලබයි. ඉකුත් වර්ෂයේ තෝරාගත් ආයතන 30 ක නියැදියක් සම්බන්ධ සිදු කළ විගණනයේදී වාර්ෂික බීඩි නිෂ්පාදනය ඒකක 31,348,500 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි වී ඇති ආයතන 536 සැලකීමේදි වාර්ෂිකව රජයට එම නිෂ්පාදන ආයතන වලින් සැලකිය යුතු බදු ආදායමක් අහිමිවන බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ ජනරාල් වෙත ලේකම් විසින් උපදෙස් ලබා දී ඇත. නැවත 2020.10.15 දින ලිපියක් යොමු කොට ඇත. ඒ අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් මත ඉදිරියේදී දුම්කොළ බදු පනතේ 2 වන වගන්තිය අනුව අවශ්‍යය කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වෙමි. | |
| (එ) | දුම්කොළ බදු පනතේ සඳහන් ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ පරීක්ෂාවේදී සංශෝධිත දුම්කොළ බදු නියෝගය 2018 ජුලි 05 වන දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකර තිබුණි. නව සංශෝධනයන් සිදුකිරීමට 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ ප්‍රතිපාදනයන් නොමැති බැවින් එකී සංශෝධනයන් සිදුකිරීමට දැනට බලාත්මක දුම්කොළ බදු පනත සංශෝධනය කළයුතු බව දන්වා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් 2019 සැප්තැම්බර් 02 වන දින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එවා ඇතත් සමාලෝචිත වර්ෂය දක්වාත් මෙහි ප්‍රගතියක් නිරීක්ෂණය නොවිනි. | පිළිතුරු ලබාදී නොමැත. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම. |
| (ඒ) | සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සිගරට් පරිභෝජනය සඳහා පමණක් නියාමනයක් සිදු කෙරේ. බීඩි පරිභෝජනය තුලින් ආඝ්‍රානය වන දුම ශරීරයට අහිතකර ලෙස බලපාන බවත්, නිදන්ගත රෝග සඳහා එය හේතුවක් වන බවත් හඳුනාගෙන ඇති අතර එය ශ්‍රම බලකායේ ඵලදායීතාවය හීනවීමට බලපෑමක් වන බැවින් බීඩි නිෂ්පාදනය නියාමනය කෙරෙහිද අවධානය යොමුකිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ. | මේ සම්බන්ධයෙන් දැඩි අවධානයෙන් කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙමින් සියලු සහකාර සුරාබදු කොමසාරිස්වරුන්, සියලු සුරාබදු අධිකාරිවරුන් හා සියලු සුරාබදු ස්ථානාධිපතිවරුන් වෙත ලිපියක් මගින් දන්වා ඇත.<br>2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ පරිභෝජනය නියාමනය හා පාලනය කිරීම තුළින් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන තුළින් සිදු වන සෞඛ්‍යය හානිය අවම කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව කටයුතු කරන බව කරුණාවෙන් දැනුම් දෙමි. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත අනුව කටයුතු කිරීම. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021ජුනි 18 වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුනි.

**3.4 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් තුනක් සකස් කර තිබුණි. එහි අවසාන කාර්තුවේ වූ ප්‍රාග්ධන වැයවිෂයන් 07 ක සහ පුනරාවර්තන වැයවිෂයන් 08 ක ප්‍රසම්පාදන කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිමවී නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය සකස් කිරීමේදී අතපසුවීමකින් එම වැය විෂයන් සියල්ලෙහිම කාර්යයන් සිදු කෙරෙමින් පවතින බව සඳහන් කර ඇත. නිවැරදිව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රගතිය මේ සමග ඉදිරිපත් කරන අතර ඉදිරියේදී එවැනි අතපසුවීම් නොවීමට වග බලා ගන්නා මෙන් අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ප්‍රසම්පාදන සැලසුම් හා කාලසටහන පරිදි නියමිත කාර්යයන් නිමකළ යුතුවීම. |
| (ආ) | ප්‍රසම්පාදන සැලස්මේ ඇතුලත් කාර්යයක් වූ සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශ 3ක, සහකාර සුරාබදු කොමසාරිස් කාර්යාල 11ක, සුරා බදු අධිකාරී කාර්යාල 24 ක හා සුරා බදු ස්ථාන 52ක විවිධ පරාශයන්ට අදාළව මත්පැන් වල සැර බැලීමේ උපකරණ කට්ටල 814 ක සහ මිනුම් සරා 138 ක අවශ්‍යතාවය හඳුනාගෙන තිබු අතර සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස මෙම උපකරණ මිලදි ගැනීම අනුමත කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන කටයුතු වල පැවති ප්‍රමාදයන් මත සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් මිලදි ගැනීම සිදු වී නොතිබුණි. | මත්පැන් සැර බැලීමේ උපකරණ මිලදී ගැනීමට අදාලව ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලද අතර ඒ සඳහා වෙළෙඳපොළ මිල සැසඳුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා ඇත. කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් එම භාණ්ඩ ආනයනය කරන රටවල් වසා ඇති බව සඳහන් කරමින් ආදර්ශ භාණ්ඩ ඉදිරිපත් නොකිරීම හා භාණ්ඩ තොග නොතිබීම හේතුවෙන් මිලදී ගැනීමට හැකියාවක් නොවීය. විටින් විට විමසීමේදීද ඉහත හේතුව සඳහන් කරන ලදී. කොවිඩ් වසංගතය හේතුවෙන් නිෂ්පාදන ආයතන පිහිටි රටවල්වලින් භාණ්ඩ ගෙන්වා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී තිබීම නිසා මෙම උපකරණ මිලදී ගැනීම ප්‍රමාද වී ඇත. එය දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් බව දන්වන අතර, නිතර විමසමින් මෙම උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කරන බවද කාරුණිකව දන්වමි. | පැසවුම්කරණයෙන් ලබාගන්නා මධ්‍යසාරවල මධ්‍යසාර ප්‍රතිශතය විවිධ අවස්ථා වලදී නිර්ණය කිරීම සඳහා ප්‍රමිත කරන ලද උපකරණ කට්ටල සුරාබදු ස්ථානය තුල තිබීම අනිවාර්ය කාර්යයක් වන අතර ඒ සඳහා දෙපාර්තමේන්තුවේ අවධානය කඩිනමින් යොමු විය යුතුවීම. |

**3.5** පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ අංක PE-0677 දරන වාහනයේ අනතුරු සම්බන්ධයෙන් සිදු වී ඇති අලාභය වූ රු. 707,155 ක මුදලින් රු. 536,771 ක මුදලක් පමණක් රක්ෂණ සමාගමෙන් අයකර ගෙන තිබූ අතර අයකර ගත නොහැකි වූ රු. 170,384 ක මුදල අදාළ වැරදිකාර පාර්ශවයෙන් අයකර ගැනිමට හෝ කපාහැරීමට කටයුතු කර නොතිබුණි. ඒ පිළිබඳව පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ කිසිදු සටහනක් ඇතුලත් කර නොතිබුණි. | නඩු කටයුතු අවසන් වූ විගස අනතුරට සම්බන්ධ EP PC-1010 රථයේ රක්ෂණ සමාගමෙන් වන්දි ලබාගෙන රජයේ ආදායමට බැර කිරීමට බලාපොරොත්තුවේ. කඩිනමින් හා නිසි ලෙස පසුවිපරම් කරවා අදාල කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3.6** විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 ගිණුම් වර්ෂය වෙනුවෙන් විගණන විමසුම් 15 ක් නිකුත් කර තිබූ අතර එම විගණන විමසුම් වලින් විමසුම් 06 කට පිළිතුරු සැපයීම සඳහා මාස 3-6 කාලයක් ගෙන තිබුණි. මාස 06 කට පෙර නිකුත්කර තිබුනද විමසුම් 06 ක් සඳහා මේ දක්වාත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම විගණන විමසුම් 06 න් 04 ක්ම යොමු වී තිබුණේ නිෂ්පාදනාගාරවලටයි. නිෂ්පාදනාගාරවල නිලධාරීන් වාර්ෂිකව ස්ථාන මාරු වීමත් කොවිඩ් වසංගත තත්වයත් හේතුවෙන් අදාල නිලධාරීන් ගෙන්වා ගැනීමටත් කාර්යාල නිලධාරීන් එම ස්ථානවලට ළඟා වීමටත් පැවති අපහසුතා නිසා මෙම තත්වය උදා වූ බව ප්‍රකාශ කරමි. මේ වන විට මෙම විමසුම්වලට අදාල පිලිතුරු මා වෙත ලැබී ඇති අතර ඉතා ඉක්මනින් ඔබ වෙත ඉදිරිපත් කරමි. ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් වැළක්වීම සඳහා සියලු නිලධාරීන් වෙත අවවාද කරන ලද බව ද කාරුණිකව දන්වා සිටිමි. | නියමිත දින වකවානු තුළ පිළිතුරු එවීමට ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නීති විරෝධි ලෙස ආනයනික ස්ප්‍රීතු භාවිතා කරන ලද සමාගමක් සම්බන්ධයෙන් සිදුකරන ලද රේගු පරීක්ෂණයේදී ලීටර් 518,600 ක් ආනයන කිරීම සම්බන්ධව ජාතික විගණන කාර්යාලයේ විමර්ශන අංශය විසින් යොමු කළ විගණන විමසුමට අදාළව තවදුරටත් ලිඛිතව කරුණු පැහැදිලි කිරීම් කරන ලෙස 2020 අගෝස්තු 28 වන දින අංක SIN/A/PI/201902 දරන විමසීම මගින් දන්වා තිබුනද මේ දක්වාත් පිළිතුරු සපයා නොතිබුණි. | මෙම විගණන විමසුම සඳහා ද මේ වන විට පිළිතුරු සකස් කර ඇති බැවින් ඉතා ඉක්මනින් ඉදිරිපත් කරමි. | නියමිත දින වකවානු තුළ පිළිතුරු එවීමට ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු කිරීම. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ----------- |
| (අ) | පළාත් සහකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරීවරුන් විසින් ඔවුන්ගේ පළාතේ වෙළඳාම පිණිස තබා ඇති රා බෝතල්වලින් සාම්පලයක් තුන්මසකට වරක්වත් ලබාගෙන රස පරීක්ෂක වෙත යොමුකර වාර්තාවක් ලබාගතයුතු වුවත් රත්නපුර අංක 1 හා අංක 2 යන රා තැබැරුම්වලින් 2017 ඔක්තෝබර් මාසයෙන් පසු 2020 වර්ෂය වනතෙක්ම සාම්පල් ලබාගෙන රස පරික්ෂක වෙත යොමුකිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට නියමිත රෙගුලාසි ප්‍රකාරව රා නිදර්ශක රස පරීක්ෂක වෙත යවා වාර්තා ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් සිටී. | නිතී රිතී ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ආ) | සමබලපත්‍රධාරි ලෙස කටයුතු කරන ලද දෙදෙනකු විසින් ර.බි 4 බලපත්‍රයක් 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම අළුත්කර තිබූ අතර දිවුරුම් ප්‍රකාශයක් මඟින් 2018 වර්ෂයේ සිට එක් අයෙකුට බලපත්‍රය නිකුත් කර තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 15 දිනැති අංක 983 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව බලපත්‍ර පැවරීමේ ගාස්තුව වන රු.15,000,000 ක මුදල අයකිරීමට කටයුතු නොකර රු.200,000 ක් පමණක් අයකර තිබුණි. සුරාබදු නිවේදන අංක 926 ප්‍රකාරව රු.1,300,000 ක මුදලක් අයකර ගත් බව මේ සඳහා යොමුකළ විගණන විමසුම සඳහා එවන ලද පිළිතුරෙහි සඳහන් විය. ඒ අනුව තවදුරටත් අයකළ යුතු මුදල රු.13,500,000 ක් විය. | බලපත්‍රධාරීට අදාළ මුදල් ගෙවන ලෙසත් එසේ නොවන්නේ නම් බලපත්‍රය දීර්ඝ නොකරන බවට දැනුම් දෙන ලදී. නමුත් බලපත්‍රධාරී විසින් ඇපිල් කෝර්ට් රිට් ඇප්ලිකේෂන් 187/2021 යටතේ අභියාචනාධිකරණයේ නඩු පවරමින් බලපත්‍රය දීර්ඝ කරවා ගෙන ඇත. ඒ අනුව නඩු තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සුරාබදු නිවේදන අංක 983 ප්‍රකාරව නියමිත ගාස්තු අය කරගැනීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සිදු කර ඇති ග්‍රහණයන්<br>සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉටුකරගැනීම සඳහා පැවරී ඇති පරමාර්ථ හා කාර්යන්ට ආදලව සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුනක සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ග්‍රහණය (වැටලීම්) කරන ලද අපරාධ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත, දුම්කොළ බදු පනත, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කර තිබූ අපරාධ ග්‍රහන සංඛ්‍යාව පිළිවලින් 3227කින්, 1934කින් හා 654 කින් හෙවත් සියයට 39 කින්, සියයට 50 හා සියයට 44 ප්‍රතිශතයකින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. | මේ යටතේ දක්වා ඇති සංඛ්‍යා දත්ත නැවත පරීක්ෂා කිරීමට අවශ්‍ය හෙයින් හා ඒ සඳහා අදාළ නිළධාරීන් දීප ව්‍යාප්ත සංචරණ සීමාවන් හේතුවෙන් මේ දිනවල සේවයට වාර්තා නොකරන හෙයින් පිළිතුරු ලබාදීම සඳහා කාලය අවශ්‍ය වේ. | අදාල පනත් වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව මත්පැන්, දුම්කොළ හා මධ්‍යසාර සහ විෂ වර්ග අබිං හා අන්තරායකර ඖෂධ යනාදිය සම්බන්ධයෙන් නිතී විරෝධී කටයුතු මැඩපැවැත්වීම සඳහා කටයුතු කළ යුතුවීම. |
| (ඈ) | බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් අතුරින් රාජ්‍ය ආදායමට ඉතා අඩු දායකත්වයක් දක්වනු ලබන නිෂ්පාදනාගාර සමාගම් 6 ක් පිළිබඳව සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සිදු කළ කාර්යසාධන විගණනයේදී නිරීක්ෂණය වු වැදගත් නිරීක්ෂණයන් සාරාංශ ගතකර කරුණු පහත දැක්වේ.<br><br>**(i)** ලේඛණ අතර නොගැලපීම්, නිෂ්පාදනාගාරවල පොත්පත්වල තොරතුරු මකා තිබීම, කපා දැමීම්, නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණය හා සාපේක්ෂව අරක්කු නිෂ්පාදනය වාර්තා නොවීම, ලේගරවලට මාරු කිරීම් සිදුකිරීමේදී මාරු කරන ලද ප්‍රමාණය හා මාරු කරන ලද ලේගරයට ලැබීම් ප්‍රමාණය පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම, ස්ප්‍රීතු ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍රවල සඳහන් ප්‍රමාණය හා ලේඛණගත ප්‍රමාණය අතර විෂමතාවන් නිරීක්ෂණය වීම.<br><br>**(ii)** විගණනයට භාජනය කරන ලද ස්කාගාර/නිෂ්පාදනාගාර 8 ක් සම්බන්ධයෙන් වෙන් වෙන් ලේගරවලින් ආසවනය සිදුකිරීමේදී නිදර්ශක ලබාගෙන ඒවා රජයේ රස පරීක්ෂක වෙත යවා විශ්ලේෂණ වාර්තා ලබාගෙන එ්වා නියමිත ප්‍රමිතියට අනුව තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා නියමිත වාර ගණනකදී වාර්තා ලබා ගැනීමට කටයුතු නොකිරීම, ලබාගත් සාම්පල් ප්‍රමාද වී රස පරීක්ෂක වෙත යොමුකිරීම, රස පරීක්ෂක වාර්තාවල සඳහන් සැර ප්‍රමාණය සහ ලේබලයේ සඳහන් සැර අතර වෙනස්කම් පැවතීම යනාදී කරුණු නිරීක්ෂණය වීම. | අදහස් දක්වා නොමැත. | අදාල නිරීක්ෂණ සම්බන්ධයෙන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවීම. |

(iii) නීති විරෝධී ලෙස දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන සුරාබදු හා රේගු බදු නොගෙවා ආනයනය කරනු ලබන ස්ප්‍රීතු භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන මත්පැන් සුලබව වෙළඳපොළේ සංසරණය වන බව ඉකුත් කාලපරිච්ඡේදය තුල සිදුකර ඇති පොලිස් විමර්ෂණ හා රේගු විමර්ෂණ තුලින් තහවුරු වී තිබීම.

(iv) නිෂ්පාදනාගාරවලින් අයවිය යුතු රාජ්‍ය බදු ආදායම සුරක්ෂිත කිරීම සඳහා නිලධාරීන් විසින් මූලිකත්වය ගෙන කටයුතු කල යුතු වීම හා ලේබල්, මූඩි හා බෝතල් භාවිතය පිළිබඳව මෙන්ම නිෂ්පාදිතය එම අමුද්‍රව්‍ය සමඟ ඇති සහ සම්බන්ධතාවය පිළිබඳ විශ්ලේෂණය කිරීම. දෙපාර්තමේන්තුව තුල රසායනාගාරයක් පිහිටුවීම තුලින් විශ්ලේෂණ කටයුතු පහසු කිරීමට අවශ්‍ය පියවර නොගැනීම.

ඉහත නිරීක්ෂණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ 19 ක් වාර්තා මගින් පෙන්වා දී තිබුනද එ් සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට වාර්තා නොවිනි.

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව අරමුණු 15කට අදාළව ලගා කරගත යුතු ඉලක්ක 37ක් සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබුණද, ඒවා දෙපාර්තමේන්තුවේ අරමුණු සහ කාර්යයභාරයන්ට නිශ්චිතවම ගලපාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 2020 වර්ෂයේදී තිරසාර සංවර්ධන අරමුණු 17 න් 15 ක් සඳහා තම මෙහෙවර, උපාය මාර්ග හා ක්‍රියාකාරකම් පෙළගස්වා ඒ සඳහා වූ කටයුතු කරන ලදි.<br>නමුදු පසුව තවදුරටත් අධ්‍යයනය කිරීමේදී ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධන අරමුණු 04ක් පැහැදිලිව හඳුනාගෙන ඒ අනුව 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා නිශ්චිත කාර්යභාරය පෙළගස්වීමට කටයුතු කරන ලදි.<br>ශ්‍රී ලංකාව තුල කිසිදු ආයතනයකට තිරසර සංවර්ධන අරමුණු 17 ම ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බව වටහා ගැනීමෙන් පසු , ඉහත සංවර්ධනය සිදු කිරීමට කටයුතු කළ බවත් ඒ අනුව සියලුම අංශවල | අරමුණු හඳුනාගෙන ඉලක්ක කරා ලගා වීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාකාරී සැලස්මට ඇතුලත් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | කාර්යභාරය නිශ්චිතව හඳුනාගැනීමට කටයුතු කර ඇති බවත් කාරුණිකව දන්වමි. | |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය පරික්ෂාවේදී අරමුණු තුනකට අදාළ ඉලක්ක තුනක කිසිදු ප්‍රගතියක් වාර්තා නොවුණි. තවද අරමුණු හතකට අදාළ ඉලක්ක නවයක ප්‍රගතිය සියයට 50 ක අඩු මට්ටමක පැවතුණි. | 2020 වර්ෂයේ මාර්තු 18 දින සිට වසර පුරා පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ආදායම් අංශය, නීති ක්‍රියාත්මක කිරීම් අංශය, සැපයුම්දාම නියාමන අංශය, මානව සම්පත් අංශය යනාදි අංශ සඳහා බරපතල ගැටලු ඇති වූ අතර ප්‍රගතිය සඳහා කොවිඩ් 19 වසංගතය දරුණු ලෙස බලපෑම් එල්ල කරන ලදි. මේ අතරින් අධ්‍යයන හා පර්යේෂණ අංශයේ පර්යේෂණ කටයුතු සඳහාද මානව සම්පත් අංශයේ පුහුණු පාඨමාලා සඳහාද නීති ක්‍රියාත්මක කිරීම් අංශයටද මෙම බලපෑම ඉතා ප්‍රබලව බලපාන ලදි. | අපේක්ෂිත ප්‍රගතිය ලගා කර ගත යුතුය. |

**5. යහපාලනය**

---------------

**5.1 අභ්‍යන්තර විගණනය**

-------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන අංශය විසින් විමසුම් 8 ක් මගින් සිය නිරික්ෂණ පෙන්වා දි තිබුණි. ඒ අනුව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ අඩුපාඩු නිවැරදි කර ගැනීම සහ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනයේ අඩුපාඩු නිවැරදි කර ගැනීම සම්බන්ධයෙන් ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට වාර්තා වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකර තිබූ විගණනයන්ට අදාළ වාර්තා ඒ ඒ අදාළ අංශවලට යොමු කර පෙන්වා දී ඇති අභයන්තර පාලනයේ දුර්වලතාවයන් අවමකර ගැනීම සහ මූල්‍ය කාර්ය සාධනයේ අඩුපාඩු නිවැරදි කිරීම අදාළ අංශ ප්‍රධානීන් හරහා සිදු කරනු ලබයි. ඊට අමතරව මේ සම්බන්ධව පවතින ගැටළු ත්‍රෛමාසිකව පවත්වනු ලබන දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටු මගින් සාකච්ඡා කර ඊට විසඳුම් ලබාගැනීම සහ ගනුලබන ක්‍රියාමාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කරනු ලබයි. | අඩුපාඩු නිවරදි කර ගැනීම හා පාලන පද්ධතීන්වල දුර්වලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 316 ක පුරප්පාඩු පැවතිණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත පුරප්පාඩුව පවතින සුරාබදු කොමසාරිස් තනතුරු 02 ක්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 02 ක් සහ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු සඳහා 2021.03.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබාදී ඇත. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අනුමත කාර්ය මණ්ඩලය බඳවාගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට විවිධ හේතූන් මත වැඩ තහනමට ලක්වූ නිලධාරින් 48 ක ගෙන් නිලධාරීන් 20 ක් සම්බන්ධයෙන් වසර 1 සිට වසර 3 ක් ඉක්මවා ඇතත් අදාළ විනය පරීක්ෂණ කටයුතු නිමවී නොතිබුණි. | වැඩ තහනමට ලක්වූ නිලධාරීන් 48 දෙනාගෙන් අල්ලස් හෝ දූෂණ දෙපාර්තමේන්තුවේ හා මහාධිකරණයේ පවතින නඩු පවතින නිලධාරීන් හැර අනෙකුත් සියළු නිලධාරීන්ගේ විනය පරීක්ෂණ පවත්වා අවසන් කොට ඇත. | විධිමත් පරිදි විනය පරීක්ෂණ කටයුතු නිමකිරීම කටයුතු කිරීම. |